www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හියුමන් රයිට්ස් වොච් වාර්තාව ශ්‍රී ලංකා ආන්ඩුවේ යුද අපරාද එළිදරව් කරයි

## HRW report exposes Sri Lankan government's war crimes

**සම්පත් පෙරේරා විසිනි**
**2009 පෙබරවාරි 25**

එක්සත් ජනපදයේ-පාදක හියුමන් රයිට්ස් වොච් (එච්ආර්ඩබ්ලිව්) විසින් පසුගිය සිකුරාදා නිකුත් කරන ලද වාර්තාවක් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ශ්‍රී ලංකා ආන්ඩුවේ යුද්ධයේ සාපරාධී ස්වභාවය පිලිබඳව එලියක් විහිදුවයි. “සිවිල් ජනයාට එරෙහි යුද්ධය නතර කරනු” යන මැයෙන් යුක්ත එම වාර්තාව, “උතුරේ වන්නි කලාපයේ සිවිල් ජනයාට එරෙහි සිය ඉවබවක්නැති කාලතුවක්කු ප්‍රහාර ද අවතැන් පුද්ගලයන් රැඳවුම් කඳවුරුවල රඳවා ගැනීමේ සිය පිලිවෙත ද වහාම නතර කරන” ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටී.

එච්ආර්ඩබ්ලිව් එල්ටීටීඊයේ මිතුරෙක් නොවේ. තවමත් ඉතිරිව පවත්නා සිය කුඩා භූමි ප්‍රදේශවලින් පිටව යාමට සිවිල් ජනයාට ඉඩ නොදීම හා එසේ පිටවීමට උත්සාහ කරන අයට වෙඩි තැබීම සම්බන්ධයෙන් එම වාර්තාව එල්ටීටීඊය විවේචනය කරයි. ජනගහන මධ්‍යස්ථාන අසල සිය සටන්කරුවන් ස්ථානගත කිරීම නතර කරන ලෙස ද එය එල්ටීටීඊයෙන් ඉල්ලා සිටී. “එක් එක් සටන්බිමේ පරාජයන්ගෙන් පසුව, දෙමල කොටි දෙමල සිවිල් ජනයාට වඩවඩා මෘග ආකාරයෙන් සලකන බව පෙනී යයි” යනුවෙන් එච්ආර්ඩබ්ලිව්හි නෛතික හා පිලිවෙත් අධ්‍යක්ෂ ජේම්ස් රොස් ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරමින් පැවසීය.

මෙම චෝදනා ශ්‍රී ලංකා ආන්ඩුව විසින් සිය යුද්ධය යුක්තියුක්ත කරනු වස් වතාවතක් ලෙස ඉදිරිපත් කරනු ලබන අතර දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය තුල ඒවා නැවතනැවතත් ප්‍රතිරාවය කෙරෙයි. කෙසේවෙතත්, එච්ආර්ඩබ්ලිව් වාර්තාව කරන්නේ, මාධ්‍ය තුල කලාතුරකින් අභියෝගයට ලක් කෙරෙන, ආන්ඩුවේ ම පච ප්‍රචාරයට වල කැපීමයි. ආන්ඩුව හා මිලිටරිය සිවිල් ජීවිත හානි සම්බන්ධයෙන් වගකීම මුලුමනින්ම ප්‍රතික්ෂේප කර ඇති අතර, එවන් සිද්ධීන් ඔප්පු වූ කල ඒ සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පවරා තිබේ.

සිය මාධ්‍ය නිවේදනය තුල, එච්ආර්ඩබ්ලිව් කිසිදු දෙගිඩියාවකින් තොරව මෙසේ පවසයි: “යුද කලාපයේ කොටු වී සිටින ජනවාර්ගික දෙමල ජනතාව එල්ටීටීඊයේ පැත්ත ගෙන ඇතැයි උපකල්පනය කල හැකි බව ද ඔවුන් සටන්කරුවන් ලෙස සැලකිය හැකි බව ද ශ්‍රී ලංකා ආන්ඩුව අඟවා ඇත. එමගින් නීති විරෝධී ප්‍රහාර සඵල ලෙස අනුමත කර ඇත. ශ්‍රී ලංකා හමුදාව අවතැන් ජනයා රොක් වී සිටින ප්‍රදේශ මත නැවතනැවතත් ඉවබවක් නැති ෂෙල් ප්‍රහාර එල්ල කර තිබේ. ආන්ඩුව ප්‍රකාශයට පත් කල ආරක්ෂිත කලාප හා කලාපයේ ඉතිරිව පවත්නා රෝහල් වෙත එල්ල කෙරුනු බවට වාර්තාගත නිමක් නැති බෝම්බ ප්‍රහාර මෙයට ඇතුලත්ය.”

වාර්තාවට අනුව, දෙසැම්බර් 10 දා සිට මේ දක්වා වන කාල පරිච්ඡේදය තුල අඩු ගනනේ සිවිල් වැසියන් 2,000ක් ඝාතනයට ලක්ව තවත් 5,000කට තුවාල සිදු වී තිබේ. වැඩෙන ජාත්‍යන්තර විවේචනයට ප්‍රතිචාර වසයෙන්, ආන්ඩුව එල්ටීටීඊ භූමි ප්‍රදේශ ඇතුලත ආරක්ෂිත කලාපයක් ප්‍රකාශයට පත් කලේය. ගුවන් හමුදා යානා, වර්ග කිලෝමීටර් 35කින් යුක්ත මෙම ප්‍රදේශයට මාරු වන ලෙස සිවිල් ජනයාගෙන් ඉල්ලා සිටින පත්‍රිකා හෙලීය. එහෙත් වාර්තාව විස්තරාත්මකව දක්වන පරිදි, ආරක්ෂිත කලාප ශ්‍රී ලංකා හමුදාවේ කාලතුවක්කු ප්‍රහාරවලට නැවතනැවතත් ලක්වී තිබේ.

කලාපය තුල සිටින සිය සගයන්ගෙන් ඇයට ලැබී ඇති කෙටි ලිඛිත පනිවිඩ පිලිබඳව සහන ඒජන්සි සේවිකාවක් එච්ආර්ඩබ්ලිව් සංවිධානයට පැවසුවාය. “ජනවාරි 22 හැන්දෑවේ සිට ජනවාරි 29 දක්වා නොනවත්නා ෂෙල් ප්‍රහාර එල්ල වුනා. සෑම දිනකම 8ත් 22ත් අතර මිනිසුන් සංඛ්‍යාවක් ඝාතනයට ලක් වෙනවා තමන් දුටු බව අපගේ සගයන් එවන එස්එම්එස් පනිවිඩවල සඳහන් වුනා. ඒ ඔවුන් දැක්ක දේ පමනයි.” යයි ඇය සඳහන් කලාය.

ඇසින් දුටුවෙක් එක ප්‍රහාරයකට පසු තත්වය විස්තර කලේය: “කාන්තාවක් අතදරුවන් දෙදෙනක් සමග උඩුබැලි අතට වැතිර සිටියා. එක ලමයෙක් පන පිටින් ඉන්න බව පෙනුනා. ලඳරුවෙක් එම පවුලට සෙවන දුන් ගසේ එල්ලී තිබුනා. තවත් ලඳරුවෙක්, හිස නැතිව, පිට්ටනිය වටා තිබෙන කටු කම්බි වැටේ රැඳී තිබුනා. කාන්තාවට එහායින් මුනින්තලා සිටියේ ඇගේ ස්වාමි පුරුෂයායි.” ෂෙල් ප්‍රහාර පැමිනියේ හමුදා ස්ථානවල සිට බව තවත් ඇසින් දුටුවෙකුගේ වාර්තා තහවුරු කලේය.

ආන්ඩුව හා මිලිටරිය, යුද්ධය පිලිබඳ මොන යම් හෝ ස්වාධීන සෘජු වාර්තාකරනයක් මුලුමනින්ම වාරනය කර ඇත. මාධ්‍යවේදීන්ට හා මානව හිමිකම් කන්ඩායම්වලට යුද කලාපවලට හා ඒ අවට ප්‍රදේශවලට ඇතුලුවීම තහනම් කර තිබේ. ඩබ්ලිව්එස්ඩබ්ලිව් සිය තොරතුරු රැස් කර ගත්තේ, උතුරු ශ්‍රී ලංකාවේ සති දෙකක කාල පරිච්ඡේදයක් තිස්සේ සංචාරයක යෙදෙමින් රහසිගත ලෙසය. එහි වාර්තාකරුවෝ එක්සත් ජාතීන්ගේ ඒජන්සි ඇතුලු දේශීය හා ජාත්‍යන්තර ආධාර සංවිධානවල සාමාජිකයන්ගෙන්, වෛද්‍ය කාර්ය මන්ඩල සාමාජිකයන්ගෙන් හා සිවිල් වැසියන්ගෙන් සම්මුඛ සාකච්ඡා ලබා ගත්හ.

එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ තුල පිහිටි තාවකාලික පුදුකුඩියුරුප්පු රෝහලට ජනවාරි 1 දා සහ ජනවාරි 26 දා අතර භාර ගත් රෝගීන්ගේ ලැයිස්තුවක් ලබාගැනීමට ඩබ්ලිව්එස්ඩබ්ලිව් සමත් විය. එම කාල පරිච්ඡේදය තුල, රෝගීන් 573ක් "ගැටුම් තුවාල" සහිතව ඇතුලු කර ගැනුනු අතර එයින් 75ක් මිය ගියේය. එම ලැයිස්තුව වත්මන් සටන්වල දී සිදුවන සිවිල් ජීවිත හානිවල පරිමාව පිලිබඳ දර්ශකයක් සපයයි.

රෝහල් ද ෂෙල් ප්‍රහාරවලට ලක් කෙරී තිබේ. දෙසැම්බර් 15 සිට පෙබරවාරි 10 දක්වා රෝහල ප්‍රහාරයට ලක්වූ අවස්ථා 20ක් එම වාර්තාව ලැයිස්තුගත කරයි. පුදුකුඩියුරුප්පු රෝහලට එල්ල කෙරුනු ෂෙල් ප්‍රහාර හමුවේ අවසානයේ දී එම රෝහල පුදුමතලාන් නම් වෙරලබඩ ගම්මානයේ පාසලක් හා ප්‍රජා මධ්‍යස්ථානයක් වෙත මාරු කිරීමට බල කෙරුනි. මෙම ස්ථානය ද නැවතනැවතත් කාලතුවක්කු ප්‍රහාරවලට ලක් වූ බව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයිසීආර්සී) වාර්තා කර තිබේ.

පුදුමතලාන්හි සේවය කරන වෛද්‍යවරයකු වන ටී. සත්‍යමූර්ති ඩබ්ලිව්එස්ඩබ්ලිව් වෙත සවිස්තර වාර්තාවක් සැපයීය: "සිකුරාදා (පෙබරවාරි 13) 100කට ආසන්න සිවිල් වැසියන් සංඛ්‍යාවක් තුවාල ලබා ඇතුලත් කලා. බ්‍රහස්පතින්දා (පෙබරවාරි 12) 87ක් ඇතුලත් කලා. ෂෙල් ප්‍රහාරවලින් ලද තුවාල, පිලිස්සුම් ලකුනු ඔවුන්ට තිබුනා. ඒත් ඔවුන්ට ප්‍රතිකාර කරන්න අවශ්‍ය මූලික බෙහෙත් වර්ග අපට නැහැ." යයි ඔහු පැවසීය.

දස දහස් සංඛ්‍යාත සරනගතයන් ප්‍රමානවත් ආහාර, සෙවන, ඇඳුම් හා වෛද්‍ය පහසුකම් නොමැතිව සති ගනනාවක් තිස්සේ සිය දිවි රැකගැනීමේ අරගලයක නිමග්න වී සිටී යන කරුන නොතකා, මිලිටරිය එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලට සහන සැපයුම් ඇතුලුවීම බොහෝ සෙයින් වලකා ඇත. ආධාර ඒජන්සියකට අනුව," වන්නි ප්‍රදේශය තුලට හා ඉන් පිටතට ප්‍රවාහන කටයුතු සංවිධානය කිරීම අසීරු වීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ, ඒ සඳහා යොදාගත යුතු මාවත සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හමුදාව හා එල්ටීටීඊය එකගතාවකට පැමිනීමට අපොහොසත් වීමයි."

එල්ටීටීඊ ස්ථාන කරා ඉදිරියට යනු පිනිස හමුදාව ආහාර රැගත් රථ කන්ඩායම් යොදා ගෙන ඇති ආකාරය විස්තර කල ඇසින් දුටුවෙකුගේ වාර්තා ඩබ්ලිව්එස්ඩබ්ලිව් සටහන් කලේය. එහි ප්‍රතිඵලයක් ලෙස, එක් රථ කන්ඩායමකට ප්‍රහාර එල්ල වූ අතර එහි ගමන ප්‍රමාද කෙරුනි. පසුදින රියදුරෙක් වෙඩි හුවමාරුවට මැදිව තුවාල ලැබීය.

එල්ටීටීඊ භූමි ප්‍රදේශවලින් පලා ඒමෙන් පසුව ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් "සුබසාධක කඳවුරු" තුල රඳවා ඇති සිවිල් ජනයාගේ ඉරනම ගැන වාර්තාව අවධානය යොමු කර ඇත. ඩබ්ලිව්එස්ඩබ්ලිව් ප්‍රකාශක රොස් මෙසේ පැහැදිලි කලේය: "දෙමල කොටි වෙතින් බේරී ඒමට සමත් වන සියලු සිවිල් වැසියන් ආන්ඩුව ආන්ඩුවේ පාලනය යටතේ පවතින අප්‍රසන්න කඳවුරුවල හා රෝහල්වල රඳවා තබා ඇත්තේ ඔවුන්ට පිටස්තර ලෝකයට ප්‍රවිෂ්ටයක් නොමැති තතු යටතේය. ඔවුන්ගේ දුක්වේදනාවන් මහජන විමර්ශනයට ලක්වීම වලකාගැනීමේ සිය ක්‍රියාකලාපය හැකි උපරිම මට්ටමකින් පවත්වා ගෙන යාමට ආන්ඩුව උත්සාහ කරන බව පෙනී යයි."

පරීක්ෂන ක්‍රියාදාමය විස්තර කල වාර්තාව, එල්ටීටීඊ සැකකරුවන් හිතුමනාපේ රඳවාගැනීම නිරන්තරයෙන් සිදු වන දෙයක් බැවින්, "බලහත්කාරී අතුරුදහන්වීම් හා අධිකරන ක්‍රියාදාමයෙන් පිටස්තර ඝාතන සිදුවීමේ හැකියාව පිලිබඳ භීතීන්" ගැන ද අනතුරු ඇඟවීය. පරීක්ෂන අදියර තුනකින් සමන්විතය. "පරීක්ෂන ක්‍රියාදාමයේ මුල් අදියර දෙක සම්බන්ධයෙන් පවතින්නේ ඉතා අල්ප තොරතුරුය. මෙම අවස්ථාවන්හි දී රඳවාගැනීම් සිදු වේ ද ඒ කොතෙක් දුරට ද යන වග සනාථ කරගැනීමේ හැකියාවක් නැත."

සරනගතයන් වවුනියාවේ රැඳවුම් කඳවුරුවලට යොමු කිරීමට ප්‍රථම හමුවන අවසන් මුරපොල වන ඕමන්තෙයිහි දී, වයස අවුරුදු 18-35 අතරේ පසුවන පුරුෂයන් හා කාන්තාවන් බොහෝ දෙනෙක් මෙන් ම ගැටවර වියෙහි ලමුන් ගනනාවක් ද ආරක්ෂක හමුදා විසින් රඳවා ගනු ලැබ ඇත. මුරපොලෙහි සිටීමට අවසර ලැබුනු එකම නිරීක්ෂකයා වන අයිසීආර්සී නිලධාරියකුට ද පෙබරවාරි 7 දා ඉවත් වන ලෙස දැනුම් දෙන ලදි. ශ්‍රී ලංකා බලධාරීන් වෙතින් රැඳවියන්ගේ ලැයිස්තු සහ ඔවුන් සිටින ස්ථාන පිලිබඳව තොරතුරු ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ ඒජන්සි ගත් උත්සාහයන් මේ වන තෙක් ඵල රහිත වී ඇතැයි ඩබ්ලිව්එස්ඩබ්ලිව් පැහැදිලි කලේය.

වවුනියා රෝහලේ තත්වය භයංකරය. මූලාශ්‍ර ගනනාවක් මෙසේ වාර්තා කලේය: "රෝගීන් රෝහලෙන් නිදහස් කොට කෙලින්ම කඳවුරු වෙත යවන්නේ ඔවුන්ගේ තුවාල සුවවීමටත් බොහෝ පෙරය." එක් අවස්ථාවක දී, ෂෙල් ප්‍රහාරයකින් තුවාල ලබා තිබූ කාන්තාවකගේ එක පාදයක් ඉවත් කෙරුනු අතර ඇය සිසේරියන්

සැත්කමකින් දරුවකු ප්‍රසූත කර තිබුනි. ඉන් දින හතරකට පසුව ඇය රෝහලෙන් යවන ලදි.

එච්ආර්ඩබ්ලිව් ප්‍රවෘත්ති නිවේදනය මෙසේ පැහැදිලි කලේයඃ “වවුනියාවේ රෝහල නගරයේ රැඳවුම් කඳවුරුවල තත්වය පිලිබිඹු කරයි. හ්‍යුමන් රයිට්ස් වොච් එහි යන විට, එහි බොහෝ මූලික අවශ්‍යතා පවා නොතිබුනිඃ රෝහලේ ඇඳන් බොහොමයක ඇඳ ඇතිරිලි, පොරෝන හෝ කොට්ට නොතිබුනි. තුවාලකරුවන්ගේ අවශ්‍යතාවන්ට යෙදීගැනීමේ හැකියාව පැහැදිලිවම නොතිබුනා වුවත්, ජාත්‍යන්තර ඒජන්සි වෙතින් කිසිදු සහායක් ඉල්ලා නොසිටින ලෙස බලධාරින් වෙතින් රෝහලේ කාර්ය මන්ඩලයට උපදෙස් ලැබී තිබූ බවට වාර්තා විය. එහි ප්‍රවිෂ්ට වීමට අවසර ලැබී තිබුනේ එවන් ඒජන්සි කිහිපයකට පමනි. ඥාතීන්ට රෝගීන් බැලීම අසීරු කටයුත්තක් විය. එලෙස පැමිනි අයගෙන් සමහරෙකුගේ නිවාස වෙත පසුව ආරක්ෂක හමුදා සාමාජිකයන් පැමින තිබේ.

“රෝහල අනිවාර්‍යයෙන් ම මිලිටරිය විසින් පාලනය හා මුර කරනු ලබන්නේ කඳවුරුවලටත් වඩා සමීප ලෙසය. නිල ඇඳුම්ලාගත් හටයෝ රෝහලේ සෑම වාට්ටුවකම, කොරිඩෝවල හා රෝහල් වත්තේ මුර සංචාරයේ යෙදෙති.” රෝහලට පැමින රෝගීන් බලා යාමෙන් පසුව “අතුරුදහන්ව ඇති” රෝගීන්ගේ ඥාතීන් සම්බන්ධ සිද්ධීන් තුනක් ගැන තමන් දන්නා බව ආධාර ඒජන්සි සේවකයෙක් එච්ආර්ඩබ්ලිව් සංවිධානයට පැවසීය.

ආන්ඩුව කිසිදු වෙනසකින් තොරව ඊනියා සුබසාධක කඳවුරුවල සියලුම සරනගතයන් රඳවා ගනියි. මෙම රැඳවුම් කඳවුරුවල “සිවිල් ඇඳුමින් සැරසුනු බුද්ධි අංශ නිලධාරින් හා පැරා-මිලිටරි කන්ඩායම්වල සාමාජිකයන් සිටින” බවට සමහර මූලාශ්‍ර වාර්තා කලේය. මිලිටරිය සමග සමීපව ක්‍රියාත්මක වන සහ මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් කුප්‍රකට දෙමල පැරා-මිලිටරි කන්ඩායමක් වන දෙමල ඊලම් මහජන විමුක්ති සංවිධානයේ (ප්ලොට්) සාමාජිකයන් දේශීය කාර්ය මන්ඩල සාමාජිකයන් විසින් හඳුනාගනු ලැබ ඇත.

එච්ආර්ඩබ්ලිව් වාර්තාවට ශ්‍රී ලංකා ආන්ඩුව හා මාධ්‍ය දක්වා ඇති ප්‍රතිචාරය පෙරදැකිය හැකි එකක් වී ඇත. “ආන්ඩුවේ ප්‍රතිරූපය කෙලෙසා” ඇතැයි මානව හිමිකම් සංවිධානයට ආන්ඩුවේ ප්‍රකාශකයන් හා පුවත්පත් අටුවාකරුවන් චෝදනා කර තිබේ. තථ්‍ය වසයෙන් ගත් කල, වාර්තාව තහවුරු කරන්නේ මාස ගනනාවක් තිස්සේ පැහැදිලිව පැවති කාරනාවයි. එනම්, ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව රටේ දෙමල සුලුතරයට එරෙහිව දුෂ්ට වර්ගෝත්තමවාදී යුද්ධයක් ගෙන යන බව ද ඔවුන් යුද අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් ද වන බවයි.

© www.wsws.org